**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**

**ලංසු සඳහා ආරාධනය**

**සනීපාරක්ෂක හා පවිත්‍රතා** කටයුතු **සඳහා මිලගණන් කැඳවීම**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, සහ බස්නාහිර පළාත් නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය යන ස්ථානයන්හි සනීපාරක්ෂක හා පවිත්‍රතා කටයුතු සිදුකිරීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් 2020.10.27 දින ප.ව. 12.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. මේ සඳහා රු.1000.00 ක ආපසු නොගෙවනු ලබන තැන්පත් මුදලක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සරප් වෙත ගෙවා ලබාගන්නා රිසිට්පතක් ප්‍රසම්පාදන අංශයට ඉදිරිපත් කිරීමෙන් පසුව ලංසු ලියකියවිලි 2020.10.05 දින සිට 2020.10.26 දින ප.ව. 3.00 දක්වා කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක.

03. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපැලෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට එවීමෙන් හෝ එම ලිපිනයේම බිම් මහලෙහි තබා ඇති ලංසු බහාලන පෙට්ටියට ගෙනවිත් බහාලීම 2020.10.27 දින ප.ව. 12.00 ට පෙර සිදුකළ යුතුය. ලංසු විවෘත කිරීම 2020.10.27 දින ප.ව. 12.00 ට සිදු කරනු ලැබේ.

04. මිලගණන් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සනීපාරක්ෂක හා පවිත්‍රතා කටයුතු සඳහා මිලගණන් කැඳවීම"** ලෙස සඳහන් කළ යුතුය.

සභාපති,

ප්‍රසම්පාදන මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අංක 383, කෝට්ටේ පාර

රාජගිරිය.